| 14*r* | බූකිරින්ද | වැලිහිස්සේ සිතානු | හේන | 0 3 33 |
| 14*s* | එම | කපුහේන්ගෙදර අප්පුහාමි | එම | 1 0 4 |
| 14*t* | කලම්බුවගහවත්ත | කොස්වත්තෙ මුතුමැනිකා | එම | 0 2 35 |
| 14*u* | එම | එම | වත්ත | 0 0 12 |
| 14*v* | එම | කපුහේනෙ උක්කුමැනිකා | එම | 0 2 14 |
| 14*w* | වැලිහිස්ස | කොස්වත්තෙ මුතුමැනිකා | හේන | 0 3 4 |
| 14*x* | අඹගස්වත්ත | එම | වත්ත | 0 1 16 |
| 14*y* | පුහුල්වෙල්වත්ත | කොස්වත්තෙගෙදර අප්පුහාමි | හේන | 0 1 30 |
| 14*z* | පිත්තලන්ද | ගමගෙදර කුමා | වත්ත | 0 0 17 |
| 15 | දුඹුලගාවහේන | කරුප්පෙන් වෙව්වි | හේන | 0 2 39 |
| 28*b*1 | උල්පොතේගෙදරඅරාව | උල්පොතේගෙදර කිරිවත්ති | කුඹුර | 0 1 21 |
| 28 | හැලවත්ත හොහොත් උඩවත්ත | කිරිවත්ති සහ තවත් | හේන | 0 3 23 |
| 28*a* | බතලවත්තෙහේන සහ වැලිහිස්ස | එම | එම | 0 2 17 |

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරණා ඉඩම් බේරුම්කරන කොමිසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවනි.

ගරුතර උතුමානන්වහන්සේගේ අණුවලෙස,

හියු ක්ලිෆර්ඩ්,
මහ සෙක්‍රටාරිස් වහිත.

## LAND ACQUISITION NOTICES.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

[Nerthipolagama and Diullewa, Kurunegala istrict.]

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්ත සාට, ඒනම් :—යාපහුවේ ආණ්ඩුවේ සෙකොලයට වත්තට සහ සෙල්ලම් පිට්ටනියක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරන පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

සිතියම 3,288. ගම—නෙර්තිපොලගම සහ දිවුල්ලෑව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| M 1252 | ගලගාවාහේන | හේන | නෙත්තිපොලගම කොන්නකෝන් කිටපූ රටේමහත්මයා | 1 0 8 |
| N 1252 | එම | පැලපොල්වත්ත | පී. ආර්. මොහම්මදු කානි | 0 1 30 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1907ක්වූ දෙසැම්බ්‍ර මස 23 වෙනි දින දවල් 1කෝ කනිසමට කුරුනෑගලදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1907ක්වූ නොවැම්බ්‍ර මස 20 වෙනි
දින කුරුනෑගල කච්චේරියේදීය.

ජේ. ඇස්. සැක්ස්ටන්,
වයඹ දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වහිත.

[Galgomuwa, Kurunegala District.]

එම් 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ගල්ගොමුවේ තානායමට වත්තක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "එම් 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමානන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 3,332. ගම—ගල්ගොමුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| O 1253 | තානායමවත්ත | එලිමහන් ඉඩම | ගල්ගොමුවේ කපුරුහාමි ලේකම | 1 2 30 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය එම් 1907ක්වූ දෙසැම්බ මස 23 වෙනි දින දවල් 1කේ කනිසමට කුරුණෑගලදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

එම් 1907ක්වූ නොවැම්බ මස 20 වෙනි
දින කුරුනෑගල කච්චේරියේදීය.

ජී. ඇස් සැක්ස්ටන්,
වයඹ දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

[Galgomuwa, Kurunegala District.]

එම් 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ගල්ගොමුවේ බෙහෙත් සාලාවේ වත්ත තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "එම් 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමානන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම් :—

සිතියම 3,332. ගම—ගල්ගොමුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| P 1253 | ඩිස්පැන්සරියේවත්ත | එලිමහන් ඉඩම | ගල්ගොමුවේ කපුරුහාමි ලේකම සහ ජයතුහාමි | 0 2 2 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය එම් 1907ක්වූ දෙසැම්බ මස 23 වෙනි දින දවල් 1කේ කනිසමට කුරුණෑගලදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

එම් 1907ක්වූ නොවැම්බ මස 20 වෙනි
දින කුරුණෑගල කච්චේරියේදීය.

ජී. ඇස්. සැක්ස්ටන්,
වයඹ දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

[Toddakadu, Mannar District.]

එම් 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම් :— මන්නාරම නගරයේ වතුර සැපයීම වැඩිදියුණුකිරීම පිණිස මෙහි පහත් සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "එම් 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම් :—

සිතියම 3,380. ගම—තෝට්ටකාඩු.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| P 296½ | මාවඩික්කිනත්තුතරෙයි නොහොත් මනල්තෝට්ටම් | වත්ත | කප්පතම්බිගේ වැන්දඹු සත්‍රී මහමදු මීරනාච්චියා සහ තවත් | 1 0 8 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය එම් 1907ක්වූ දෙසැම්බ මස 20 වෙනි දින පෙරවරු 11 කනිසමට මන්නාරමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

එම් 1907ක්වූ නොවැම්බ මස 13 වෙනි
දින මන්නාරමේ කච්චේරියේදීය.

ජී. ඇෆ්. ආර්. බ්‍රව්නිං,
ආණ්ඩුවේ උපඒජන්ත වම්හ.

[Tender for License to sell Opium by Retail, Local Board, Negombo.]

වර්ෂ 1903නේ 14 වෙනි ආඥාපත්‍රයේද, 1899යේ 5 වෙනි ආඥාපත්‍රයේද ප්‍රකාර මීගමුවේ ලෝකල්බෝඩ් නගරයේ 1908වේ ජනවාරි මස 1 වෙනි දින පටන් දෙසැම්බ්‍ර මස 31 වෙනි දින දක්වා අබිං බෙදා විකිණීමට ලයිසන්ස් (බලකඩදාසි) මිලේට ගැනීම පිණිස දෙන "ටැන්ඩර්ස්" (ඉල්ලුම්පත්‍ර) බස්නාහිර පලාතේ ආණ්ඩුවේ වංශාධිපති ඒජන්තතුමා විසින් 1907ක්වූ නොවැම්බ්‍ර මස 25 වෙනි දින දවල් 12 වනතුරු කොළඹ කච්චේරියේදී බාරගනුලැබේ.

2. වර්ෂ 1907ක්වූ නොවැම්බ්‍ර මස 25 වෙනි දින දවල් 12ට කොළඹ කච්චේරියට තමාම හෝ ලියවිල්ලකින් බලයදෙනලද තමාගේ කළමනාකාරයා හෝ පැමිණ ලයිසන්ස් ලබන පිණිස තමා ඔප්පුකර සිටින මුදල් ගණනෙන් තුනෙන්පංගුවක් වහාම බදින්ට සූදානම්ව සිටියොත්මිස නැත්නම් කිසිම ටැන්ඩර්පත්‍රයක් කල්පනාවටගනු නොලැබේ.

3. ටැන්ඩර්පත්‍ර දෙකක නොහොත් වැඩිගණනක මුදල් ගණන එකසමානවිනම් බද්ද ඒකී ඉල්ලුම්කාරයන් අතරේ වෙන්දේසියේ දමා එමලේම විකිනීමට හෝ අලුතුවෙන් ටැන්ඩර් ඉල්ලන්ට හෝ 1899යේ 5 වෙනි ආඥාපණතේද, 1903නේ 14 වෙනි ආඥාපණතේද කියා තිබෙන ප්‍රකාර වෙන ආකාරයකින් තීන්දුකිරීම හෝ බස්නාහිර පලාතේ වංශාධිපති ආණ්ඩුවේ ඒජන්තතුමාගේ කැමැත්තේ හැටියට කළහැකිය.

4. ටැන්ඩර් දමන අයගේ සම්පූර්ණ නම සහ ඔහුට ලියුම් ලැබෙන ස්ථානය සෑම ටැන්ඩර්පත්‍රවලම සඳහන්විය යුතුයි.

5. ඉතා ඉහල ටැන්ඩරය හෝ කොයියම් ටැන්ඩරයක් හෝ භාරගැනීමට බස්නාහිර පලාතේ ආණ්ඩුවේ වංශාධිපති ඒජන්තතුමා බැඳීනැත.

6. යමෙකුගේ ටැන්ඩරය නොහොත් ඉල්ලීම භාරගතහොත් ඒ අය ලයිසන්ස් ගැණුම්කාරයා වන්නේය, ඔහු එවලේම ඔහුගේ ටැන්ඩරයේ මුදලෙන් තුනෙන් පංගුවක් ගෙවිය යුතුයි. තවත් මින්පසු දක්වන කොන්දේසියේ කාරණා ඉෂ්ටකළ යුතුයි.

7. ටැන්ඩර් පෝර්මකොල කොළඹ කච්චේරියේදී ලබාගත හැකිය.—බෙදා විකුණන අවසරපත්‍ර තුනයි.

---

## බෙදා විකිණීමට ලයිසන්ස් (අවසරපත්‍ර) දීමේ කොන්දේසි.

අබිං විකිණීමට මිලගෙවා ලයිසන්ස් (අවසර) ලබාගන්නා අය විසින් ඔහු ගැණුම්කාරයා බව එකී නිසි බලය ලත් මුලාදෑනිතැන විසින් කියාදුන් වහාම තමා ඉල්ලුම්කළ ගණනෙන් තුනෙන් පංගුවක් මුදලෙන් ගෙවන්ට ඕනෑය. ඒ මුදල ඒ බලයලත් මුලාදෑනිතැන විසින් ඇපයක් වශයෙන් තිබාගන්ට යෙදෙනවා ඇත. ගැණුම් මුදලේ වරින්වර ගෙවන කොටසක් වෙනුවට එය හිලව්කරන්ට ආපුළුවන. නුමුත් අන්තිම භාරමාසේට ගෙවන කොටස්වලට එය හිලව්කළ හැකිය. ගැණුම් මුදල මාසෙකට දෙළහෙන් පංගුව බැගින් තමාගේ බද්ද පවතින අතරතුර එක එක මාසේ අන්තිම දවසේදී ගෙවියයුතුයි. පළමුවෙනි වාරේ කොටස වර්ෂ 1908ක්වූ ජනවාරි මාසේ 31වෙනි දින ගෙවිය යුතුයි. වාර ගෙවිල්ලක් ප්‍රමාදකරන එක එක දවසට අවුරුද්දට සියේට නවය ගණනේ වැටෙන පොලී ගෙවිය යුතුයි. ඇප මුදල ගැණුම්කාරයාගේ ඉල්ලීම පිට ඔහු විසින් නියමකරන බැංකියක නිශ්චල මුදලක්කොට දැමිය හැකිය. එය නැතිවිනම් එහි අලාබය ඔහු විසින් දැරියයුතුයි. නියම දවසේදී යම් වාරමුදල් කොටසක් නොගෙවනලද්දේනම්, නිසි බලයලත් මුලාදෑනිතැන විසින් ඒ ලයිසන්ස් නොහොත් එයින් ගතනොවී තිබෙන කාලප්‍රමාණය එයින් වන පාඩුවට ලයිසන්ස්කාරයා යටත්කොට විකිණිය හැකිය.

2. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ස්ටෝරුව නොහොත් ඉඩම මේ ලයිසන්ස් පත්‍රය තුළ සම්පූර්ණයෙන් විස්තර කළ යුතුයි. මේ ලයිසන්ස් (අවසරය) එකී විස්තරකළ ඉඩමට මිස ඉන් මනාත් කිසිවකට ඇතුලත් නොවේ.

3. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩම වෙනයම් ගොඩනැගිල්ලක් නොහොත් ඉඩමක් සම්බන්ධව ඇතුළතින් යාම් එම්වලට අවකාශ ඇතුව තිබියයුතු නොවේ.

4. මෙයින් ලයිසන්ස් දෙනුලබන ගේදොර ශුබපවිත්‍රවද සනීපලැබෙන අන්දමටද තබාගත යුතුයි.

5. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩම පරීක්ෂාකරන්ට නිසි බලයලත් මුලාදෑනිතැන විසින් ලියවිල්ලක් පිට පත්කරන කෙනෙකුට නොහොත් ඉන්ස්පැක්ටර් තනතුරකට පහත්නොවන යම් පොලිස් මුලාදෑනියෙකුට දොරවල් ඇරලා පෙන්වීම ඒ ගේදොර භාරව සිටින අයගේ යුතුකමක්ය. තවත් තමා ලඟ තිබෙන අබිං ගැනීම හෝ අලෙවි කිරීම සම්බන්ධ පොත්පත් ලියවිලි නොහොත් ගණන් ලේඛන පෙන්වීමටද, විශේෂයෙන් ඕනෑකළොත් පරීක්ෂාකරන වේලාවට තමා ලඟ නොහොත් ගේදොරෙහි තිබෙන සියලුම අබිං ඉන්ස්පැක්ටර්තැන හෝ පොලිස් මුලාදෑනියා ඉදිරිපිටදී කිරා පෙන්වීමට හෝ භාරේ සිටින අය බැඳිසිටින්නේය. ලඟ තිබෙන අබිං ප්‍රමාණයෙත්, පොත්වල හැටියට පරීක්ෂාකරන වේලාවට තිබියයුතු ප්‍රමාණයෙත් වෙනසක් දකින්ට තිබුනිනම් භාරකාරයා විසින් තමන්ට හැකිපමණින් ඊට කාරණා පෙන්විය යුතුයි.

6. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේදී අබිං කන්ට ඉඩදිය යුතුනොවේ.

7. මෙයින් ලයිසන්ස් දෙනලද ඉඩමෙහි තබාතිබෙන අබිං යම් විධියකින් අන් ද්‍රව්‍ය හා සමග මිශ්‍රකිරීමක් නොහොත් එහි ගතිය නරක්කිරීමක් හෝ නොකළ යුතුයි.

8. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි කෝලාහල ආදී නොනිසි හැසිරීම්වලට ඉඩනොදිය යුතුයි.

9. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේ මත්බීම නොහොත් අබිං පාවිච්චිකරලා මත්ව සිටින යම් අයෙකුට නොහොත් වයස පහලොහෙන් අඩුලෙස පෙනෙන යමෙකුට අබිං දියයුතු නොවේ.

10. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමට රාත්‍රියේ අටටත් උදේ හයටත් අතරේ අබිං භාරගන්ට හෝ එයින් එය පිටකරන්ට හෝ යුතුනොවේ.

11. පිටු ගණන්කර ඉලක්කම් දමා බැඳපු බඩු ගණන්ගන්නා පොතක් මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි තිබාගත යුතුයි. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමට මෙකී අන්දමේ පොතක් ලයිසන්ස්කාරයා තමාගේ ලයිසන්ස් පත්‍රය ගන්නාවිට නිසි බලයලත් මුලාදෑනිතැන විසින් නොමිලයේ දෙනුලැබේ. අලුත් පොතක් ඕනෑවිනම් ලයිසන්ස්කාරයා විසින් නිසි බලයලත් මුලාදෑනිතැනගෙන් මුදලට ගතයුතුයි. ඒ මුලාදෑනිතැනට පළමුවෙන් දීපු පොත භාර දිය යුතුයි.

12. ලැබුනාවූ සියලුම අබිංවල ගණන්ද, අලෙවිවූ ප්‍රමාණයද ඒ ගනුදෙනුවූ වහාම බඩු ගණන්ගන්නා පොතේ නිරවුල්ව සටහන්කිරීම ලයිසන්ස්කාරයාගේ යුතුකමක් වන්නේය. පොතේ සියලුම කට්ටි හරිලෙස පිරවිය යුතුයි. තවත් ලඟ තිබෙන ප්‍රමාණය දවස පටන්ගැන්මේදීත් කෙළවරේදීත් පැහැදිලිලෙස පෙනෙන්ට තිබියයුතුයි.

13. එක එක මාසේ දෙවෙනි දින නොහොත් ඊට මත්තෙන් බඩු ගණන්ගන්නා පොතේ හරි පිටපතක්ද, නොම්මර 20 කොන්දේසියේ ප්‍රකාර තිබාගන්ට ඕනෑකරන පොතේ හරි පිටපතක්ද පොලිසියේ ඉන්ස්පැක්ටර් ජනරාල්තුමා වෙත ඇරවීම ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

14. පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල්තුමාට ඒ හරි පිටපත් ලැබුනුවිට ඒ බවට කුවිතාන්සියක් ඇරීම එතුමාගේ යුතුකමකි. හරි පිටපත් ඇරලා සතියක් ඇතුළත ලයිසන්ස්කාරයාහට එවැනි කුවිතාන්සියක් නොලැබුනිනම් එකී පිටපත් ලැබුනාද නැද්ද කියා පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල්තුමාගෙන් විභාගකිරීමද, එය නොලැබී තිබුනානම් එයින් පිටපත් ඇරීමද ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

15. තමාගේ ලයිසන්ස් පත්‍රය ලැබෙන්ට ප්‍රථමයෙන්, මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි වැඩට පත් කරන්ට අදහස්කර සිටින අයවලුන්ගේ නාම සටහන්වන ලැයිස්තුවක් නිසි බලයලත් මූලාදෘනිතැනට ඔප්පුකිරීම ලයිසන්ස්කාරයාගේ යුතුකමකි. වැඩට පත්කරනලද එක එක අයගේ සම්පූර්ණ නම සහ විස්තරය මෙහි ලියවිල්ලෙහි අඩංගුවිය යුතුයි. තවත් ඒ එක එක අය විසින් කරන්ටයන වැඩේ සවභාවද සඳහන්කළ යුතුයි. මේ අයවල් වයස අවුරුදු විස්එකෙන් වැඩිවූවෝ වියයුතුයි. ඔවුන් හොඳ කල්ක්‍රියාවේ අයවල් බව නිසි බලයලත් මූලාදෘනිතැනට ඒත්තුවියාම ඕනෑකෙරේ. මේ ලයිසන්ස් පත්‍රයෙහි නිසි බලලයත් මූලාදෘනියා විසින් නාම ඒත්තුනොගත් කිසිකෙනෙකුන් ලයිසන්ස්කාරයා වෙනුවට අබිං භාරව සිටින්ට හෝ අබිං භාරගන්ට හෝ විකුණන්ට හෝ පත්කරගතයුතු නොවේ. නාම ඒත්තුනොගත් කිසිකෙනෙකුට යටකී කිසි කටයුත්තක් කරන්ට ලයිසන්ස්කාරයා විසින් ඉඩදිය යුතු නොවේ.

16. වැඩට පත්ව සිටින අයවලුන්ගේ ලැයිස්තුව අමුතුකරන්ට උවමනාවූ කල්හි ඒ ගැන නිසි බලයලත් මූලාදෘනිතැනගෙන් කලින්කල ඉල්ලුම්කළයුතුයි. ඒ කරන වෙනසක් ඇත්නම් මේ ලයිසන්ස් පත්‍රයෙහි ඒ ඒත්තුගත් බවට සටහන්කළ යුතුයි. තවත් මෙයින් ලයිසන්ස් ලැබූ ඉඩමක වැඩට පත්ව සිටින යම් අයෙකු අහක්කරන්ට කියා බලයලත් මූලාදෘනිතැනගෙන් දැන්වීමක් ලැබුනවිට එය ලැබී සතියක් ඇතුළත ඒ වැඩකාරයාගේ නම ලැයිස්තුවෙන් අහක්කරන පිණිස මේ ලයිසන්ස් කඩදාසිය නිසි බලයලත් මූලාදෘනිතැන වෙත ඔප්පුකළ යුතුයි. ඉන්පසු ඒ අය මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි වැඩට අයෝග්‍යවන්නේය.

17. මේ ලයිසන්ස් කඩදාසියේ නොම්මරයද, ලයිසන්ස්කාරයාගේ නාමද, "අබිං බෙද විකිණීමට ලයිසන්ස් ලදී" යන වචනද ලෑල්ලක පහසුවෙන් කියවන්ට හැකිලෙස ලියා මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේ ප්‍රකාශ ස්ථානයක පිහිටුවා තිබ්බවීම ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

18. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩම අබිං සහ සුරුට්ටු විකිණීම පිණිස මිස වෙන වැඩකුට හෝ කාරණයකට ගතයුතු නොවේ.

19. අත්පිට ගෙවන මුදලට මිස අබිං විකිණීය යුතුනොවේ.

20. ඩ්‍රෑම්ස් 4කට වැඩි බර ඇති අබිං කොටසක් විකුණනලද කල්හි මිලටගත් අයගේ සම්පූර්ණ නම ගමද, විකුණපු ප්‍රමාණද, විකුණපු දිනද බඩුගණන් පොතේ වැඩිමනත් කාරණ සටහන්කරන්ට තිබෙන කට්ටියෙහි සඳහන් කිරීම ලයිසන්ස්කාරයාගේ යුතුකමක්.

21. හරි තරාදියක්ද, මෙහි පහත දක්වන ප්‍රමාණ පඩිද මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි නිතරම පාවිච්චියට ගැනීම පිණිස ලයිසන්ස්කාරයා විසින් තැබිය යුතුයි.

එවොසිර්ඩුපොයි : අවුන්ස් $\frac{1}{4}$, අවුන්ස් $\frac{1}{2}$, අවුන්ස් 1, අවුන්ස් 2, අවුන්ස් 4, අවුන්ස් 8, රාත්තල් 1, රාත්තල් 2, රාත්තල් 4, රාත්තල් 7.

22. ලයිසන්ස්කාරයා තමාගේ පොත්පත් තැබීම පිණිස මින්පසු සඳහන්කරණ ගුරුකම් පිළිපැදිය යුතුයි.

---

අබිං බෙදා විකුණන අයගේ බඩුගණන් පොතේ ආදර්ශ පිටුව.

| දිනම. | | ර. | අවු. | ඩ්‍ර. | ලැබුණේ කාගෙන්ද. | වැඩිමනත් කාරණ. |
|---|---|---|---|---|---|---|
| ජූනි 1.—අතේ තිබෙන ඉතිරි අබිං | ... | 17 | 8 | 4 | | |
| ලැබුනා ... | ... | 10 | 8 | 2 | ... ජූවන්පුල්ලේ නො. 1 තොග බෙදු විකුණන්නා. | |
| මුළුගණන | ... | 28 | 0 | 6 | | |
| පිටදුන්නා ... | ... | 1 | 7 | 9 | | |
| අවසාන ඉතුරු ගණන | ... | 26 | 8 | 13 | | |
| ජූනි 2.—ලැබුනා ... | ... | නැහැ. | | | | |
| මුළුගණන | ... | 26 | 8 | 13 | | |
| පිටදුන්නා ... | ... | 0 | 15 | 5 | | |
| අවසාන ඉතුරු ගණන | ... | 25 | 9 | 8 | | |
| ජූනි 3.—ලැබුනා ... | ... | නැහැ. | | | | |
| මුළුගණන | ... | 25 | 9 | 8 | | |
| පිටදුන්නා ... | ... | 2 | 7 | 1 | | |

බඩු ගණන් පොත තැබීමට ගුරුකම්.

සිහිකටයුත්තක්.—ඉංග්‍රීසියෙන්ද සවභාෂා දෙකෙන්ද මේ ගුරුකම්වල කොපි දෙකක් බඩු ගණන් පොතේ එක එක කවරේ ඇතුල්පැත්තේ ප්‍රවේසම්ලෙස ඇලවිය යුතුයි.

මේ පොත තැබියයුත්තේ එවොසිර්ඩුපොයි බර ක්‍රමයටයි.

එවොසිර්ඩුපොයි බර :

| | | | |
|---|---|---|---|
| ඩ්‍රෑම්ස් | 16 | = අවුන්ස් | 1 |
| අවුන්ස් | 16 | = රාත්තල් | 1 |
| රාත්තල් | 28 | = ක්වාටර් | 1 |
| ක්වාටර් | 4 | = හොණ්ඩර | 1 |
| හොණ්ඩර | 20 | = ටොන් | 1 |

සැලකියයුත්තක්.—ග්‍රෙන්ස් 180ක් එවොසිර්ඩුපොයි ඩ්‍රෑම්ස් 6·582, එනම් ඩ්‍රෑම්ස් 7ට ආසන්නයි.

## අබිං තබාගැනීමටද නොබෙදූ විකිණීමටද ලයිසන්ස් (අවසරපත්‍ර) දීමේ කොන්දේසි.

1. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ස්ටෝරුව නොහොත් ඉඩම මේ ලයිසන්ස් පත්‍රය තුළ සම්පූර්ණයෙන් විස්තර කළ යුතුයි. මේ ලයිසන්ස් (අවසරය) එහි විස්තරකළ ඉඩමට (ගේදෙරට) මිස ඉන්මනත් කිසිවකට ඇතුළත් නොවේ.

2. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩම වෙනයම් ගොඩනැගිල්ලක් නොහොත් ඉඩමක් සම්බන්ධව ඇතුළ තින් යාම් ඊම්වලට අවකාශ ඇතුව තිබියයුතු නොවේ.

3. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ගේදෙර ශුඩ පවිත්‍රවද සනීප ලැබෙන අන්දමටද තබාගත යුතුයි.

4. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩම පරීක්‍ෂාකරන්ට නිසි බලයලත් මුලාදෑනිතැන විසින් ලියවිල්ලක් පිට පත්කරන කෙනෙකුට නොහොත් ඉන්ස්පැක්ටර් තනතුරකට පහත් නොවන යම් පොලිස් මුලාදෑනියෙකුට දොරවල් ඇරලා පෙන්වීම ඒ ගේදෙර භාරව සිටින අයගේ යුතුකමක්ය. තවත් තමා ලඟ තිබෙන අබිං ලැබීම හෝ අලෙවි කිරීම සම්බන්ධ පොත්පත්, ලියවිලි නොහොත් ගණන් ලේඛන පෙන්වීමටද, විශෙෂයෙන් ඕනෑකළොත් පරීක්‍ෂාකරන වේලාවට තමා ලඟ නොහොත් ගේ දෙරෙහි තිබෙන සියලුම අබිං ඉන්ස්පැක්ටර්තැන හෝ පොලිස් මුලාදෑනියා ඉදිරි පිටදී කිරා පෙන්වීමටද භාරේ සිටින අය බැඳී සිටින්නේය. ලඟ තිබෙන අබිං ප්‍රමාණයෙත්, පොත්වල හැටියට පරීක්‍ෂා කරණ වේලාවට තිබියයුතු ප්‍රමාණයෙත් වෙනසක් දකින්ට තිබුණිනම් භාරකාරයා විසින් තමන්ට හැකිපමණින් ඊට කාරණ පෙන්විය යුතුයි.

5. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහිදී අබිං කන්ට ඉඩදිය යුතුනොවේ.

6. මෙයින් ලයිසන්ස් දෙනලද ඉඩමෙහි තබා තිබෙන අබිං යම් විධියකින් අන් ද්‍රව්‍ය හා සමග මිශ්‍රකිරීමක් හෝ එහි ගතිය නරක්කිරීමක් නොකළ යුතුයි.

7. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි කෝලාහල ආදි නොනිසි හැසිරීම්වලට ඉඩ නොදියයුතුයි.

8. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේදී මත්වීම නොහොත් අබිං පාවිච්චිකරලා මත්වසිටින යම් අයෙකුට නොහොත් වයස පහළොහෙන් අඩුලෙස පෙනෙන කෙනෙකුට අබිං දියයුතු නොවේ.

9. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමට රාත්‍රියේ 8ටත් උදය 6ටත් අතරේ අබිං භාරගන්ට හෝ එයින් එය පිටකරන්ට හෝ යුතුනොවේ.

10. පිටු ගණන්කර ඉලක්කම් දමා බැඳපු බඩු ගණන්ගන්නා පොතක් මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩ මෙහි තබාගත යුතුයි. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමට මෙහි අන්දමේ පොතක් ලයිසන්ස්කාරයා තමාගේ ලයිසන්ස් පත්‍රය ගන්නාවිට නිසි බලයලත් මුලාදෑනිතැන විසින් නොමිලයේ දෙනුලැබේ. අලුත් පොතක් ඕනෑවීනම් ලයිසන්ස්කාරයා විසින් නිසි බලයලත් මුලාදෑනිතැනගෙන් මුදලට ගතයුතුයි. ඒ මුලාදෑනිතැනට පළමුවෙන් දීපු පොත භාරදිය යුතුයි.

11. ලැබුනාවූ අබිංවල සියලුම ගණන්ද අලෙවිවූ ප්‍රමාණයද ඒ ගණුදෙනුවූ වහාම බඩු ගණන්ගන්නා පොතේ පිළිවෙලින් සටහන්කිරීම ලයිසන්ස්කාරයාගේ යුතුකමක් වන්නේය. පොතේ සියලුම කට්ටි හරිලෙස පිරවිය යුතුයි. තවත් ලඟ තිබෙන ප්‍රමාණය දවස පටන්ගැන්මේදීත් කෙළවරේදීත් පැහැදිලිලෙස පෙනෙන්ට තිබිය යුතුයි.

12. ඉකුත්වූ මාසයේ එක එක දවසේ පටන්ගැම්මේදී සහ අවසානයේදී ලඟ තිබෙන ඉතුරු ප්‍රමාණයද එක එක දවසේදී ලැබුනාවූද අලෙවිවූනාවූද ප්‍රමාණයත් පෙන්නුම්කර හරි ලුහුඬු ලේඛනයක එක එක මාසයේ දෙවෙනි දින නොහොත් ඊට ප්‍රථමයෙන් පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල්තැනට යැවීම ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

13. ලයිසන්ස් දෙනුලැබූ එක එක ස්ථානයේ පාවිච්චිය පිණිස මේ ලුහුඬු සටහනේ පෝර්ම විසිහතරක් නිසි බලයලත් මුලාදෑනිතැන විසින් ලයිසන්ස් පත්‍රය නිකුත්කරනවිට ලයිසන්ස්කාරයාට නොමිලයේ දෙනුලැබේ. මින්මනත් ඕනෑකරන පෝර්ම නිසි බලයලත් මුලාදෑනිතැනගෙන් මිලේටගන්ට ඕනෑකෙරේ.

14. එක එක ලුහුඬු සටහන ලැබුනවිට ඒ ලැබුන බවට තුවිතන්සියක් ඇරීම ඉන්ස්පැක්ටර් ජනරාල්තුමාගේ යුතුකමකි. මේ ලුහුඬු සටහන තැපැල්කර සතියක් ඇතුළත එවැනි තුවිතන්සියක් ලයිසන්ස්කාරයාට නොලැබුනි නම්, ඒ ලුහුඬු සටහන ලැබුනාද නැද්ද කියා පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල්තුමාගෙන් විභාගකිරීමද එය නොලැබී තිබුනානම් එයින් පිටපතක් ඇරීමද ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

15. තමාගේ ලයිසන්ස් පත්‍රය ලැබෙන්ට ප්‍රථම මෙයින්, ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි වැඩට පත්කරන්ට අදහස්කර සිටින අයවලුන්ගේ නම් සටහන්වන ලැයිස්තුවක් නිසි බලයලත් මුලාදෑනියාට ඔප්පුකිරීම ලයිසන්ස්කාරයා ගේ යුතුකමකි. වැඩට පත්කරනලද එක එක අයගේ සම්පූර්ණ නම සහ විස්තරය මෙහි ලියවිල්ලෙහි අඩංගුවිය යුතුයි. තවත් ඒ එක එක අය විසින් කරන්ට යන වැඩේ ස්වභාවද සඳහන්කළ යුතුයි. මේ අයවල් වයස අවුරුදු විසිඑකෙන් වැඩිවූවෝ වියයුතුයි. ඔවුන් හොඳ කල්ක්‍රියාවේ අයවල් බව නිසි බලයලත් මුලාදෑනිතැනට ඒත්තුවියාම ඕනෑකෙරේ. මේ ලයිසන්ස් පත්‍රයෙහි නිසි බලයලත් මුලාදෑනියා විසින් නම ඒත්තුනොගත් කිසිකෙනෙකුන් ලයිසන්ස්කාරයා වෙනුවට අබිං භාරව සිටින්ට හෝ අබිං භාරගන්ට හෝ විකුණන්ට හෝ පත්කරගත යුතුනොවේ. නම ඒත්තු නොගත් කිසිකෙනෙකුට යටකී කිසි කටයුත්තක් කරන්ට ලයිසන්ස්කාරයා විසින් ඉඩදිය යුතුනොවේ.

16. වැඩට පත්වසිටින අයවලුන්ගේ ලැයිස්තුව අලුත්කරන්ට උවමනාවූ කල්හි ඒ ගැන නිසි බලයලත් මුලාදෑනිතැනගෙන් කලින්කල ඉල්ලුම්කළ යුතුයි. ඒ කරන වෙනසක් ඇත්නම් ඒ ලයිසන්ස් පත්‍රයේ ඒ ඒත්තුගත් බවට සටහනක් කළයුතුයි. තවත් මෙයින් ලයිසන්ස් ලැබූ ඉඩමක වැඩට පත්ව සිටින යම් අයෙකු අහක්කරන්ට කියා බලයලත් මුලාදෑනිතැනගෙන් දැන්වීමක් ලැබුනාවිට එය ලැබී සතියක් ඇතුළත ඒ වැඩකාරයාගේ නම ලැයිස්තුවෙන් අහක්කරන පිණිස මේ ලයිසන්ස්කඩදාසිය (බලකඩදාසිය) නිසි බලයලත් මුලාදෑනිතැන වෙත දැක්විය යුතුයි. ඉන්පසු ඒ අය මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි වැඩට අයොග්‍යවන්නේය.

17. මේ ලයිසන්ස් කඩදාසියේ නොම්මරයද, ලයිසන්ස්කාරයාගේ නමද, "අබිං බෙදූ විකිණීමට ලයිසන්ස් ලදී" යන වචනද ලෑල්ලක පහසුවෙන් කියවන්ට හැකිලෙස ලියා මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේ ප්‍රකාශ ස්ථානයක පිහිටුවා තිබ්බවීම ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

18. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේ ස්ටෝරුවට පාවිච්චිකරන කොටස අගුළුලා වසා තිබිය යුතුයි පරීක්‍ෂාකරන මුලාදෑනියාද ලයිසන්ස්කාරයාද මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේ වැඩට පත්වූ අයෙක්මෙන් ලයිසන්ස් පත්‍රයේ නම ඒත්තුගෙන තිබෙන අයද හැර අන් කිසිවෙකුට ස්ටෝරුවට යාමට ඊමට අවසර නැත.

19. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩම අබිං විකිණීම පිණිස මිස වෙන වැඩකට හෝ කාරණයකට ගතයුතු නොවේ.

20. මෙයින් අවසරදෙනුලැබූ ඉඩමෙහි අබිං නොඇරපු ගුලි වශයෙන් තැබියයුතුයි. කපාපු, කඩාපු, නොහොත් යම් විධියකින් ඇරපු ගුලි මේ ඉඩම්වලට භාරගන්ටවත් එහි තබන්ටවත් නුසුදුසුයි. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි නිතර පාවිච්චියට ගතහැකි හරි තරාදියක්ද, මෙහි පහත දක්වන ප්‍රමාණ එවොයිර්ඩුපොයි බරද ලයිසන්ස්කාරයා විසින් තිබාගතයුතුයි. අවුන්ස් $\frac{1}{4}$, අවුන්ස් $\frac{1}{2}$, අවුන්ස් 2, අවුන්ස් 4, අවුන්ස් 8, රාත්තල් 2, රාත්තල් 4, රාත්තල් 7.

21. ලයිසන්ස්කාරයා විසින් මින්පසු සඳහන්කරන ගුරුකම් තමාගේ පොත් තබාගැනීමේදී පිළිපැදිය යුතුයි.

---

## අබිං තිබාගැනීමටත් නොබෙදූ විකිණීමටත් ලයිසන්ස් ලැබූ අයවල් විසින් එක එක මාසේ දෙවෙනි දින පසුවෙන්ට ප්‍රථමයෙන් පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල්තුමාට ඇරියයුතු දින ලේඛනයේ ආදශී පෝර්ම.

| දෘතම. | | | | රු. අ. ඩු. |
|---|---|---|---|---|
| ජූනි 1.—ලඟ තිබෙන ප්‍රමාණය | ... | ... | ... | 120 0 0 |
| භාරගත්තා | ... | ... | ... | 80 0 0 |
| | | | | 200 0 0 |
| පිටට දුන්නා | ... | ... | ... | 72 0 0 |
| ජූනි 2.—ලඟ තිබෙන ප්‍රමාණය | ... | ... | ... | 128 0 0 |
| භාරගත්තා | ... | ... | ... | — |
| පිටට දුන්නා | ... | ... | ... | — |
| ජූනි 3.—ලඟ තිබෙන ප්‍රමාණය | ... | ... | ... | 128 0 0 |

## අබිං තිබාගැනීමට නොහොත් නොබෙදූ විකිණීමට ලයිසන්ස් දෙනුලැබූ අයවලුන්ගේ බඩු ගණන්පොතේ ආදශී පෝර්මය.

| දින. | ලඟ තිබෙන ප්‍රමාණය. | භාරගත්තා. | | පිටට දුන්නා. | | | ගණන් පියවන විට ඉතිරිව තිබුනා. |
|---|---|---|---|---|---|---|---|
| | | භාරගත් ගණන. | භාරගත්තේ කාගෙන්ද. | පිටට දුන්නේ කාටද. | පිටට දුන් ගණන. | පිටට දුන් මුළුගණන. | |
| | රු. අ. ඩු. | රු. අ. ඩු. | | | රු. අ. ඩු. | රු. අ. ඩු. | රු. අ. ඩු. |
| ජූනි 1 | 120 0 0 | 80 0 0 | නොම්මර 1 දරන ජුවන්පුල්ලේ රාමැති නොබෙදූ විකුණන්නාගෙන් | පානදුරේ නොම්මර 1 දරන ස්ථානයේ හෙන්රි පෙරේරා බෙදූ විකුණන්නාට ... | 7 8 0 | | |
| | | | | වැල්ලවත්තේ නොම්මර 3 දරන ස්ථානයේ ඩේවිඩ් සිංඤෝ බෙදූ විකුණන්නාට ... | 14 8 0 | | |
| | | | | කොට්ටිච්චියේ නොම්මර 2 දරන ස්ථානයේ කදිරවේල් නොබෙදූ විකුණන්නාට ... | 50 0 0 | 72 0 0 | |
| | | | | | — | — | 128 0 |
| ජූනි 2 | 128 0 0 | | | | | | |

## බඩුගණන් පොත තබාගැනීමට ගුරුකම්.

සිහිවීම පිණිසයි.—ඉංග්‍රීසියෙන් සහ ස්වදේශික භාෂාවලින්ද මේ ගුරුකම් අඩංගු පිටපත් දෙකක් බඩුගණන් පොතේ පිටකොළේ ඇතුල් දෙපැත්තේ ප්‍රවේසම් සහිතව අලවා තැබිය යුතුයි.

මේ පොත එවොයිර්ඩුපොයි බර ක්‍රමයෙන් තැබිය යුතුයි.

එවොයිර්ඩුපොයි බර.

| | | | | | |
|---|---|---|---|---|---|
| ඩ්‍රැම්ස් | 16 = අවුන්ස් | 1 | කාර්තු | 4 = හොන්ඩර | 1 |
| අවුන්ස් | 16 = රාත්තල් | 1 | හොන්ඩර | 20 = ටොන් | 1 |
| රාත්තල් | 28 = කාර්තු | 1 | | | |

වර්ෂ 1907ක්වූ නොවැම්බර් මස 14 වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඇල්. ඩබ්ලිව්. බූත්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

[Tender for Transport of Salt, Puttalam District]

"ගැණුම්කාරයින්ට ලුණු කිරා ගෙණගොස් භාරදීමට 'ටැන්ඩර්ය' යි" පිටකොලේ ලියනලද ඉල්ලුම් පත්‍ර පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේ විසින් වර්‍ෂ 1907ක්වූ දෙසැම්බර් මස 14 වෙනි දින උදේභාගේ 11 වනතුරු බාරගනු ලැබේ.

කරත්තවලට සහ පාරුවලට පුත්තලමෙන් විකුනනලද ලුණුකිරා ඒවාට ගොස් බාරදීමට පහත සඳහන් කාරණ ඉල්ලුම්කාරයෝ විසින් සිත්හි ගතයුතුයි.

(1) 1908 අවුරුද්දට.
(2) 1908 සහ 1909 අවුරුදුවලට.
(3) 1908, 1909 සහ 1910 අවුරුදුවලට.

කරත්තවලට සහ පාරුවලට ලුණු කිරා ගෙණගොස් බාරදීමට වෙන්වසයෙන් හොන්ඩර 1,000කට අයකළ යුතු ගණන මෙපමණයයි කියා සඳහන්කරන්ට ඕනෑය.

දවස්පතා හොණ්ඩර 2,000 බැගින් කිරා ගෙණගොස් බාරදීමටත් ඊට සෑහෙන තරම කුලීකාරයින් යොදවන්ටත් සෑදීපෑහෑදී සිටින්ට ඕනෑය.

වර්‍ෂ 1908වේ ජනවාරි මස 3 වෙනි දින වැඩ ආරම්භ කරන්ට ඕනෑය.

ඉල්ලුම්පත්‍ර දැමීමට ප්‍රථම රුපියල් 50ක් කච්චේරියේ තැන්පත්කළ යුතුයි.

එයාකාර තැන්පත් නොකරණලද යමෙකුගේ ඉල්ලුම් පත්‍ර ගැණ සලකණු නොලැබේ.

එසේ තැන්පත්කරණලද මුදල කොන්ත්‍රාත්තුවට හරියාකාර බැඳීමට ලෑස්තිව නොසිටියොත් නොහොත් හරියාකාර වැඩේ සිඬකිරීමට රුපියල් 1,000කට සහතික ඇප දීමට නුපුළුවන්වූවොත් තහනම්වෙන්ට යෙදේ. තහනම් නොකරණලද මුදල් ඒ ඒ තැන්පත්කාරයින්ට ආපසු දෙනු ලැබේ.

එක එක ඉල්ලුම්කාරයා ඔහුට ලියුම් ලැබෙන්ට පුළුවන් ස්ථානයක් පුත්තලමෙන් සඳහන්කළ යුතුයි.

වැඩේ හරියාකාරකිරීමට බැඳෙන සහතික ඇපකාරයෝ දෙදෙනෙකුගේ අත්සන් ඇති ලියමනක් ඉල්ලුම් පත්‍රය සමග එවන්ට ඕනෑය.

ඉල්ලුම්පත්‍රයේ සඳහන්කරණ ගණන් වෙනස්කරණවිට එහි ඉල්ලුම්කාරයා විසින් ඔහුගේ අත්සනේ මුලකුරු දැමිය යුතුයි.

ඉල්ලුම්පත්‍රයෙන් පිටපතක් ගරුකටයුතු ආදායම් පරීක්‍ෂක උන්නාන්සේටත් තැපෑලෙන් එම දවසේම යැවියයුතුයි.

ඉල්ලුම්පත්‍ර කඩා බලන දවසේදී ඕනෑවූවොත් කථාකිරීමට සියලු ඉල්ලුම්කාරයින්ම පැමිණ සිටින්ට ඕනෑය.

ඒ. සී. ඕල්නට්,
උප ඒජන්ත උන්නාන්සේ.

වර්‍ෂ 1907ක්වූ නොවැම්බර් මස 19 වෙනි
දින පුත්තලම් කච්චේරියේදීය.

---

[Tender for Materials for Salt Stores, Hambantota.]

මෙහි පහත සඳහන් ද්‍රව්‍ය සපයාදීමට "(A) හම්බන්තොට සහ (B) කිරින්දේ ලුණු ගුදම්වලට උවමනා දේවල් වර්‍ෂ 1908ක්වූ අවුරුද්ද තුළදී සපයාදීමට ඉල්ලුම්පත්‍රය" යි පිට ලියා මුද්‍රතබනලද ඉල්ලුම්පත්‍ර වර්‍ෂ 1907ක්වූ දෙසැම්බර් මස 4 වෙනි දින දවල් 12හ වනතුරු භාරගනු ලැබේ.

ද්‍රව්‍යවල විස්තර.

| | | |
|---|---|---|
| පොල්අතු (අලුත් දිගින් අඩි 6ට අඩු නොවන) | ... ... | 1,000 |
| කොහුලනු (වේලිච්චා හොඳලනු) | ... | හොන්ඩරයක් |
| පොල්තෙල් | ... ... | ගැලොමික් |
| භූමිතෙල් | ... ... | එම |
| උමං ලී, අඩි 18ක් දිග | ... | 100 |
| බට බම්බු | ... ... | 100 |
| කූඩා (පළල අඟල් 18ක්, උස අඟල් 7ක්) | ... ... | 100 |
| කත්ලි | ... ... | එකක් |
| දෙල්ලෑලි, සපුලෑලි, කොස්ලෑලි, අඹලෑලි | ගණකම අඟලක් හෝ වැඩියෙන්ද, පළල අඟල් 4ක් හෝ වැඩියෙන්ද | හතරැස් අඩියක් |
| තම්බපු හුනුමුල් | ... | 100 |
| අළුහුණු | ... ... | බුසලක් |
| තාර | ... .. | ගැලොමක් |
| ගල්මිල්ල බාල්ක | ... | අඟල් 3 × 4 |
| බුරුත බාල්ක | ... ... | එම 2 × 12 |
| පොල්පරාල | ... ... | එම 2 × 4 |
| එම | ... ... | එම $1\frac{1}{2}$ × 2 |
| කරච් කනු දිග අඩි 8, වට අඟල් 18 | | |
| එම 12 එම 18 | | |
| බිත්ති ලී (මෝපා) ගල්තුළු, දිග අඩි 12, වට අඟල් 12 | ... | 100 |
| කෝමු (තරන, උල්කෙන්ද හෙවත් ගල්කෑර) | ... ... | 100 |
| කරුව් කනු (දිග අඩි 15, වට අඟල්18). | | |
| ගෝනි මළු, අළුත් (දිග අඩි 3, පළල අඩි 2). | | |
| ඉදිකටු | ... ... | එකක් |

ඉල්ලුම්කාරයින් විසින් මෙහි පහත සඳහන් උවමනා සැලකිය යුතුයි.

පොල්අතු සහ ලීත් ඊට ලැබෙන ආඥාවල් ලැබී දවස් පහළොහකින් මෙපිට භාරදිය යුතුයි.

ඉල්ලුම්පත්‍ර දැමීමට මත්තෙන් එකී ඉල්ලුම්කාරයා විසින් කච්චේරියේ රුපියල් 20ක් බැඳියයුතුයි. එසේ නොබැන්දවූ ඉල්ලුම්කාරයාගේ ඉල්ලීම කල්පනාවට ගනු නොලැබේ. කොන්ත්‍රාත්තුවට බැඳීමට ඉල්ලුම්කාරයා සූදනම්ව නොසිටියොත් නොහොත් කොන්ත්‍රාත්තුවේ වැඩ නිසිසේ කිරීමට රුපියල් 1,000කට සහතික ඇප දීමට ඔහුට නුපුළුවන්වූනොත් එකී මුදල ආණ්ඩුවට තහනම්වේ, තහනම්කරණු නොලැබූ මුදල් ඉල්ලුම්කාරයින්ට ආපසු ගෙවනු ලැබේ.

ඉල්ලුම්කාරයා විසින් සටහන්කළ ඉල්ලීමේ ගණන් ආපසු ඒ පත්‍රයේ වෙනස්කළොත් එතැන්හි ඔහුගේ අත්සනේ මුල් අකුරු සටහන්වී තිබෙන්ට ඕනෑය.

ඉල්ලුම්පත්‍රය හම්බන්තොට උප ඒජන්ත උන්නාන්සේට භවන්නාවූ වේලාවටම එයි පිටපතක් ඉල්ලුම්කාරයා විසින් තැපෑලෙන් කොළඹ වංශාධිපති ආදායම් පරීක්‍ෂක උන්නාන්සේටද යැවිය යුතුයි.

ඉල්ලුම්පත්‍ර ඇරලා බලන දවසට ඉල්ලුම්කාරයෝ කච්චේරියේ සිටිය යුතුයි. මක්නිසාද ඕනෑවූනිනම් ඔවුන්ට හෝ ඔවුන්ගෙන් යම් කෙනෙක් හා සමග කථාකරන්නට පුළුවන්වෙන පිණිසය.

යම් ඉල්ලුම්පත්‍රයක් බ'රගැණීමට හෝ අහක්කිරීමට ආණ්ඩුවට බලය තිබේ.

ඇල්. ඩබ්ලිව්. ඊ. ස්ක්‍රාදර්,
උප ඒජන්ත වම්ග.

වර්‍ෂ 1907ක්වූ නොවැම්බර් මස 14 වෙනි
දින හම්බන්තොට කච්චේරියේදීය.

---

[Cancellation of Re-sale of Arrack Rent Notice, Central Province.]

වර්‍ෂ 1908ක්වූ ජනවාරි මස 1 වෙනි දින පටන් වර්‍ෂ 1908ක්වූ දෙසැම්බර් මස 31 වෙනි දින වනතුරු මධ්‍යම. දිසාවේ අරක්කු රේන්දය වර්‍ෂ 1907ක්වූ නොවැම්බර් මස 25 වෙනි දිනදී නැවත විකිනීමට නියමකළ බවට වර්‍ෂ 1907ක්වූ නොවැම්බර් මස 15 වෙනි දින නොම්මර 6215හේ ගැසැට්පත්‍රයේ පෙණෙන වර්‍ෂ 1907ක්වූ නොවැම්බර් මස 13 වෙනි දින දරන නොතීසිය මෙයින් අවලංගු කරන්ට යෙදුනවග දන්වමි.

ජේ. පී ලුවිස්,
මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත
උන්නාන්සේ වෙනුවට.

වර්‍ෂ 1907ක්වූ නොවැම්බර් මස 19 වෙනි
දින මහනුවර කච්චේරියේදීය.

[Re-sale of Toll Rents, Galle District.]

වර්ෂ 1907ක්වූ දෙසැම්බර් මස 1 වෙනි දින සිටන් 31 වෙනි දින වනතුරු, මෙහි පහත සඳහන්වෙන රේන්ද පළමු ගැනුම්කාරයින්ගේ අප්‍රයෝජනයට ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1907ක්වූ නොවැම්බර් මස 30 වෙනි සෙනසුරාදා දවල් සීනුවේ 10 ප්‍රසිද්ධ වෙන්දේසියේ මාතර කච්චේරියේදී දෙවනු විකුණන්ට යෙදෙනවා ඇත, එනම් :—

පොල්වත්ත සහ පොල්කඳන්ඇල පාලම් රේන්දය.
තල්පාවෙල පාරේ රේන්දය සහ බන්ඩත්තර පාලම් රේන්දය.
ගොඩගම පාරේ රේන්දය.
අතුරැස්සේ පාලම් රේන්දය.
හක්මන පාරේ රේන්දය.

ඉල්ලුම්කාරයෝ විසින් රේන්දය ගන්ට දෙන මුදලෙන් දහයෙන් පංගුවක් රේන්දේට ඇප පිණිස අත්පිට ගෙවා ලබන දෙසැම්බර් මස 10 වෙනිදාසින් මෙහා ඕනෑ ඇප සම්පූර්ණකරන්ට ඕනෑය.

තවද ඇප ඔප්පු සම්පූර්ණකරණතුරු මාසෙක බදු මුදල අත්පිට බඳින්ට ඕනෑය.

දෙවනු විකිනීමට කාරණය ඔක්තෝම්බර් මාසේ ගෙවිය යුතු මුදල නොගෙවී නිසාය.

ජේ. ඕ. ඩබ්ලියු. රොක්,
ආණ්ඩුවේ ඒජන්තතැන වෙනුවට.

වර්ෂ 1907ක්වූ නොවැම්බර් මස 16 වෙනි
දින ගාල්ලේ කච්චේරියේදීය.

---

[Supreme Court Criminal Sessions, Kandy.]

ශ්‍රී ලංකාද්වීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය කරණකොට ගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම්, බදුළු දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1907ක්වූ දෙසැම්බර් මස 2 වෙනි දින පෙරවරු 11 පැය පටන් මහනුවර තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබා ගෙණ මිස එයින් පිටතට යන්ටනුසුදුසුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

ජී. ඇෆ්. රොබර්ට්ස්,
පිස්කල්තැන වෙනුවට.

වර්ෂ 1907ක්වූ නොවැම්බර් මස 14 වෙනි දින
බදුල්ලේ පිස්කල් කන්තෝරුවේදීය.

---

[Destruction Valueless Records, Court of Requests, Colombo.]

කොළඹ රික්වැස්ට් උසාවියේ වර්ෂ 1886ක්වූ දෙසැම්බර් මස 8 වෙනි දින නොම්මර 48,001කේ සිට වර්ෂ 1890ක්වූ ජූලි මස 31 වෙනි දින නොම්මර 58,366 දක්වා තිබෙන පරණ සහ නොවටිනා නඩු පොත් මෙහි පහත පෙනෙන දිනේ සිට තුන්මාසයක් ගිය පසු වර්ෂ 1894ජේ 12 වෙනි ආඥාපණතේ ප්‍රකාරයට පුළුස්සා දමන බව මෙයින් දන්වමි. යමෙකුට මෙයින් යම් නඩු පොතක් පුළුස්සා නොදමා තබාගන්ට ඕනෑනම්, ඒ බව තමන්ම උසාවිය ඉදිරියේ පෙනීසිට නොහොත් පෙරකදෝරුකෙනෙක් ලවා, නැත්නම් ලියූ අයගේ අත්සන ඇති පෙත්සමකින් උසාවිය පිළිගන්නා සැටෙන කරුණු පෙන්වා, ඒ පුළුස්සා නොදමනලෙස ඉල්ලාසිටිය යුතුයි.

ඈම්. ඈස්. පින්තු,
කොමසාරිස් උන්නාන්සේ.

වර්ෂ 1907ක්වූ නොවැම්බර් මස 20 වෙනි
දින කොළඹ රික්වැස්ට් උසාවියේදීය.

---

[Election of Unofficial Members, Local Board, Jaffna.]

ජාපනේ ලෝකල්බෝඩ් හෙවත් සනීපආරක්ෂාකිරීමේ සහ නගරය දියුණුකිරීමේ සභාවට නිල නොදරන සමාජිකවරු තුන්දෙනෙක් තෝරාගැනීම පිණිස වර්ෂ 1898වේ නොම්මර 13 දරණ ලෝකල්බෝඩ් හෙවත් සනීප ආරක්ෂා පිළිබඳ ආඥාපණතේ රෙගුලාසි ප්‍රකාර සම්මුතියක් වර්ෂ 1907ක්වූ දෙසැම්බර් මස 14 වෙනි සෙනසුරාදා පෙරවරු 11 ඝනිසමට ජාපනේ කච්චේරියේදී පවත්වන්ට මම අදහස්කර තිබෙන බව මෙයින් ප්‍රසිද්ධලෙස දැනුම්දෙන්ට යෙදේ.

ඈෆ්. එච්. ප්‍රයිස්,
උතුරු පලාතේ ඒජන්තතැන වම්හ.

වර්ෂ 1907ක්වූ නොවැම්බර් මස 14 වෙනි
දින ජාපනේ කච්චේරියේදීය.

---

## UNOFFICIAL ANNOUNCEMENTS.

### අ නා ඥ න් වී ම්.

[Chinnatambi Joseph Kanthappah.]

වර්ෂ 1907තේ නොම්මර 1 දරණ 8 වෙනි වගන්තියේ ප්‍රකාර දැනට මඩකලපූ දිස්ත්‍රික්කේ ආරපත්තුව යන ගම පදිංචි සින්නතම්බි ජෝසප් කන්දප්පා වන මම මෙවක් පටන් තුන්මාසයක් ඇතුළත මඩකලපූ පලාතේ දෙමළ භාෂාවෙන් ප්‍රසිද්ධ නොතාරිස්කෙනෙක්ව වැඩකිරීම සඳහා ගරුකටයුතු රිජිස්ත්‍රාර් ජනරාල් උතුමානන්ගෙන් බලය ලබාගැණීමට ඉල්ලුම්කිරීම මගේ අදහස බව මෙයින් දැනුම්දෙමි.

මෙවගට,
සින්නතම්බි ජෝසප් කන්දප්පා.

වර්ෂ 1907ක්වූ ඔක්තෝම්බර් මස 5 වෙනි දිනදීය.